# ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව
# පිරිපහදු කාර්යාංශය
# 2021/2022 වර්ෂය සඳහා
# කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම

තරඟකාරී ඉල්ලුම්කිරීමේ පදනම මත පහත සඳහන් කාර්යයන්/ සේවාවන් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය අවස්ථාවන්හිදී භාරගැනීමට කැමති කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමට ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශය අදහස් කරනු ලැබේ.

අ. සිවිල්, යාන්ත්‍රික සහ විදුලි කාර්යයන් වන ඉන්ධන ටැංකි ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම, ටැංකි පිරිසිදු කිරීම, තාප හුවමාරු ටියුබ් බන්ඩල පිරිසිදු කිරීම, අධිපීඩන වැලි විදිනයෙන් යකඩ මල ඉවත්කිරීම සහ උපකරණවල තීන්ත ආලේප කිරීම, යකඩ සහ යකඩ නොවන ලෝහවල ලියවනපට්ටල වැඩ සහ වාත්තු කිරීමේ වැඩ, මුහුනත් දැඩි කිරීම් ඇතුළුව ගෙවී ගිය යන්ත්‍ර කොටස් වල පිලිසකර කිරීම්, ලෝහ ආලේපනය කිරීම් සහ බෙයාරින් පිරවීම වැනි කාර්යන්, රබර් ප්ලාස්ටික් සහ පයිබර් ග්ලාස්වලින් නිමවුන උපාංග සෑදීමේ කාර්යයන්, පිරිපහදු උපකරණ සඳහා වානේ ව්‍යූහයන් සෑදීම, අමතර කොටස් නිෂ්පාදනය කිරීම, සිවිල් ඉංජිනේරුමය වැඩ සහ ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුමය කටයුතු කිරීම, මෝටර් රථ සහ ගෘහ භාණ්ඩ කුෂන් වැඩ, ටයර් නැවත පිරවීම, වාහන ටින්කරින් වැඩ, රේඩියේටර් අලුත්වැඩියා කිරීම, සිලින්ඩර් බෝර කිරීම, ස්ලීව් ගැසීම, සහ ක්‍රෑන්ක් ශාෆ්ට් ග්‍රයින්ඩින් කිරීම, සයිලන්සර් සෑදීම, රෝදක පළු ඇලවීම, වාහන අළුත්වැඩියාව, ඒ. සී. සහ ඩී. සී. මෝටර් එතීම, ශීතකරණ හා වායුසමීකරණ අළුත්වැඩියාව සහ RT,UT,MT,PT යනාදී නිර්විනාශක පරීක්ෂන කාර්යයන් සිදුකිරීම.

ආ. පැස්සුම් යන්ත්‍ර, වායු සම්පීඩන යන්ත්‍ර, ජංගම දොඹකර, ක්‍රෝලර් දොඹකර, ජංගම පොම්ප, සෑන්ඩ් බ්ලාස්ටින් උපකරණ, වානේ පලංචි උපකරණ, ද්‍රාව ජැලැන්තු (හයිඩ්‍රොලික් ) එසවීමේ උපකරණ, ෆෝක්ලිෆ්ට් ට්‍රක්, ජලයේ බහාලිය හැකි පොම්ප, විදුලි උත්පාදක යන්ත්‍ර, පස් කපා ඉවත් කරන උපකරණ, ට්‍රැක්ටර්, ගල්රෝල, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර සහ බදාම විදීමේ යන්ත්‍ර, බූම් ට්‍රක්, බැකෝලෝඩර් යන්ත්‍ර, පෝකර් වයිබ්‍රේටර් යන්ත්‍ර යනාදිය කුලියට සැපයීම.

ඇ. පිරිපහදුවේ යාන්ත්‍රික, විදුලි, උපකරණ සහ සිවිල් ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා පුහුණු හා අර්ධ පුහුණු කම්කරුවන් සහ සනීපාරක්ෂක කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම.

ඇ. හදිසි අවශ්‍යතාවන්හිදී ගිලන් රථයක් අදාල කාර්ය මණ්ඩලය සහ අවශ්‍ය උපකරණ සහිතව සැපයීම.

පිරිපහදුව තුළ දැනටමත් ලියාපදිංචි වී ඇති සහ අලුතින් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන සියළුම කොන්ත්‍රාත්කරුවන් ලිඛිත ඉල්ලීමක් සමග පිරිපහදු මුදල් අංශයට ආපසු ගෙවනු නොලබන රු.100/= ක මුදලක් ගෙවීමෙන් අයදුම්පත් ලබාගත හැක.

එසේම අන්තර් ජාලයේ www.ceypetco.gov.lk වෙබ් අඩවිය මගින් අයදුම්පත් නොමිලේ බාගත කර ගත හැක..

අයදුම්පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 2021 ජූලි මස 14 වැනි දින 15.00 පැය දක්වා වන අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 ජූලි මස 27 වැනි දින 14.30 පැයට හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලබා දිය යුතුය.

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (නඩත්තු හා යෝජනා ක්‍රම)**
**ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව,**
**පිරිපහදු කාර්යාංශය,**
**සපුගස්කන්ද,**
**කැළණිය.**